දෙහිඕවිට ප්‍රාදේශීය සභාව

කැගල්ල දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන, 2010 මාර්තු 31 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව , දෙහිඕවිට ප්‍රාදේශීය සභාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට දෙහිඕවිට ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2009 වර්ෂයේදී 2010 වර්ෂය වෙනුවෙන් ලැබුණු අක්කර බදු රු.42,309 ක් ගිණුම් වල නොදැක්වීමෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද, 2010 ජනවාරි 01 දින අයවිය යුතු අක්කර බදු රු. 92,374 ක් අඩුවෙන් ගිණුම් වල දැක්වීමෙන් වර්ෂයේ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා 2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු අක්කර බදු රු.49,453 ක් ගිණුම් වල නොදැක්වීමෙන් සමාලෝචිත වර්ෂයේ සමස්ථ අක්කර බදු ආදායම රු. 85,250 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂය තල අක්කර බදු ලේඛනය අනුව කපාහැරීම් රු.43,692 ක් වුවද, ගිණුමෙන් රු.100,939 ක් කපා හැරීම නිසා වර්ෂයේ අක්කර බදු ආදායම රු.57,247 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) උපලබ්ධි වූ ස්ථාවර තැන්පත් වටිනාකම වූ රු.1,700,000 ක් එම ගිණුම බැරකර , මුදල් ගිණුමට බැර කරනු වෙනුවට අධිකතා ඌනතා ගිණුමට හරකර තිබූ හෙයින් එය 2.4.3 අයශීර්ෂය යටතේ ගිණුම්ගත කිරීම නිසා ආදායම එම පමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් රු.6,000,000 ක් ණය මුදලින් සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ බැකෝ යන්ත්‍රයේ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඉ) 2007 හා 2008 වර්ෂ වලදී ඉදිකරන ලද ආදාහනාගාරයේ වටිනාකම වූ රු.9,225,930 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඊ) 2007, 2008 හා 2010 වර්ෂ වලදී දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගත් රු.11,800,000 ක ණය ගිණුම්ගත නොකිරීම නිසා ශේෂ පත්‍රයේ එම බැරකම නිරූපණය නොවය.

(උ) ඉහත ණය මුදල පියවීම සඳහා සභාව විසින් ගෙවනු ලබන ණයවාරික හා පොලිය ස්ථාවර නියෝග අනුව බැංකුව විසින් ගෙවනු ලබන බැවින් බැංකු සැසඳුම් ප්‍රකාශ යාවත්කාලීනව පිළියෙල නොකිරීම හේතුවෙන් ගෙවීම් කොපමණද යන්න තහවුරු කරගත නොහැකි වූ අතර, ගිණුම් ගත කිරීමක්ද සිදුකර නොතිබුණි.

(ඌ) 2010 දෙසැම්බර්31 දිනට ලැබිය යුතු ආයෝජන පොලී රු.918,424 ක් ලෙස ගිණුම්වල දක්වා තිබුණද එදිනට ආයෝජන වල වටිනාකම රු.700,000 ක් වුවද,අදාල පොලී ප්‍රමාණය ගණනය කොට ගිණුම්ගත කරනු වෙනුවට අධික පොලී ප්‍රමාණයක් ගිණුමෙහි දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ ආයෝජන පොලී ලෙස 2010 පෙබරවාරි 01 දින ලැබී තිබූ රු.221,850 ක මුදල ඉකුත් වර්ෂයට අදාල ලැබූ ආදායමක් වුවද, සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.13,438 ක ආයෝජන පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි.

(ඔ) ලේඛනය අනුව 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.4,200,000ක් වුව ද ගිණුම් වල රු.15,450,675 ක් ලෙස දැක්වීමෙන් වර්ෂයේ ලැබිය යුතු මුද්දර ගාස්තු රු.11,250,675 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ ලැබූ මුද්දර ගාස්තු රු.4,507,344 ක් වුවද වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට පොදු තැන්පත් යටතේ ගිණුම් ගතකර තිබුණි.

(ක) ලේඛනය අනුව 2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.3,500,000 ක් වුවත් ගිණුම් වල රු.8,308,862 ක් ලෙස දැක්වීමෙන් වර්ෂයේ ලැබිය යුතු උසාවි දඩ මුදල් රු.4,808,862 කින් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි.

(ග) 2010 දෙසැම්බර් 31 දිනට සේවක ඇප තැන්පත් ශේෂය රු.121,217 ක් වුවත් රු.77,024 ක් ලෙස දැක්වීමෙන් රු.44,193 කින් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ජ) 2009 දෙසැම්බර් 31 දිනට පැවති රු.880,657 ක් වූ සංවර්ධන සංචිතය සමාලෝචිත වර්ෂයේදී ගිණුම් වලින් අත්හැර තිබුණි.

(ට) 2008 වර්ෂයේ සිට පැවත එන රු.782,806 ක ණය මුදාලීම් ගිණුමේ හර ශේෂය නිරවුල් කිරීමට කටයුතු නොකර මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

ගිණුම් විෂයයන් 03 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු.6,086,398 ක් වූ අතර , උපයෝගී ලේඛන / වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.3,496,277 ක් විය.

1.3.3 <u>අවිනිශ්චිත ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවිනිශ්චිත ස්වභාවයේ ගිණුම්වල බැර ශේෂ එකතුව රු.4,553 ක් විය.

1.3.4 <u>ගෙවිය යුතු ගිණුම්</u>

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු 15,702,776 ක් විය.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

<u>අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.37,708,501 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.6 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය

| නීති,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 170 වගන්තිය | අයවැය ලේඛනයෙන් යෝජනා කොට ඇති වියදම් විචලනය කිරීමට සභාපතිවරයාට බලය පවරා ඇතත් සමාලෝචිත වර්ෂයේදී ඇතැම් වැය ශීර්ෂ වල ඇස්තමේන්තු වියදම් ඉක්මවා වියදම් දැරීම සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි |
| (ආ) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත 7 (i) වගන්තිය | සෑම වසරකම කාර්තුව අවසන් වී දින 15 ක් ඇතුලත අය කරන ලද මුද්දර බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වරයා වෙත ප්‍රේෂණය කලයුතු වුවත් 2008 තුන්වන කාර්තුවේ සිට 2009 හතර වන කාර්තුව දක්වා අයකරන ලද රු.72,127 ක මුදල සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන රීති සංග්‍රහය | |
| (i) රීති 166 | සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ලෙජරයට ආරම්භක ශේෂයන් ඇතුලත් කිරීම සඳහා ජර්නල් සටහන් භාවිතා කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | රීති 168 | ඉකුත් වර්ෂය සඳහා වූ ගිණුම් සාරාංශයෙහි පිටපතක් ගිණුම් විගණනය සඳහා සභාපතිවරයා විසින් ඉදිරිපත් කලයුතු වුවත් ,ගිණුම් ඉදිරිපත් කල කාලය තුල පාදේශීය සභා විසුරුවා තිබූ බැවින් බලයලත් නිලධාරි වශයෙන් කටයුතු කල ප්‍රාදේශීය ලේකම්ගේ සහතික කර්මකින් තොරව ගිණුම්, විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල්රෙගුලාසි සංග්‍රහය | |
| (i) | මු.රෙ.395 (ඇ) | එක් එක් මාසය අවසානයේදී ඊළඟ මාසයේදී 15 දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවත් ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන අංක 2235101 ,2235102 හා 2235125 දරන බැංකු ගිණුම් සඳහා අවසන් වරට බැංකු සැසඳුම් පිළියෙල කර තිබුණේ 2009 දෙසැම්බර් මාසය සඳහා පමණි. |
| (ii) | මු.රෙ.387 | චෙක්පත් මගින් කරන ගෙවීම් සඳහා තම බැංකු ශේෂය ප්‍රමාණවත් දැයි ගෙවන නිලධාරියා විසින් සොයා බැලීමකින් කටයුතු කලයුතු බව දැක්වෙතත් අංක 0002235101 දරන බැංකු ගිණුම සඳහා එසේ සොයා බැලීමකින් තොරව කටයුතු කර ඇති බව 2010 අප්‍රේල් බැංකු වාර්තාව අනුව නිරීක්ෂණය විය. |
| (iii) | මු.රෙ.756 | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දින හෝ එකී දිනට ආසන්නව භාණ්ඩ පිළිබඳ වාර්ෂික සමීක්ෂණයට සමීක්ෂණ මණ්ඩලයක් පත්කර ඇතත් 2011 මැයි 25 දින වන විටත් භාණ්ඩ සමීක්ෂණ කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන අතුරු ව්‍යවස්ථාවේ xxii වන කොටස 21 වගන්තිය | ආවරණය කල වාහනයක හෝ ආවරණය කල කුඩයක බෙලෙක්කයක හෝ වෙනත් යෝග්‍ය භාජනයක මස් ප්‍රවාහනය කලයුතු වුවත් ඊට පටහැනිව ත්‍රිරෝද රථ වල ප්‍රවාහනය සඳහා අවසර ලබා දී තිබුණි. |
| (ඊ) | 2006 සැප්තැම්බර් 21 දිනැති ප.ප.කො. චක්‍රලේඛ අංක 2006/03 උපදෙස් අංක 1 | සේවා ගිවිසුම් යටතේ බඳවාගත හැකි තනතුර දක්වා ඇතත් එයට පටහැනිව පුස්තකාල සහායකයින් දෙදෙනෙකු බඳවාගෙන තිබුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,866,868 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉකමවූ ආදායම රු9,953,159 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය | ඇසතමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු ...000 |
| (i) වරිපනම් හා බදු | 1,343 | 2,049 | 3,595 | 1,353 | 85 | 4,062 |
| (ii) බදු කුලී | 2,724 | 2,135 | 685 | 2,730 | 2,723 | 81 |
| (iii)බලපත්‍ර ගාස්තු | 540 | 562 | - | 460 | 460 | 156 |
| (iv) වෙනත් ආදායම් | - | - | - | - | - | - |

2.2.2. <u>උසාවි දඩ මුදල්</u>

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 02ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 8,308,862 ක දඩ මුදලක් සභාවට ලැබිය යුතුව තිබුණි .

2.2.3 <u>මුද්දර ගාස්තු</u>

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු 15,450,675 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 <u>හිඟ වරිපනම් බදු හා අක්කර බදු</u>

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතෙ 158 (i) වගන්තියේ විධිවිධාන අනුව යම් වරිපනම් බද්දක් හෝ අක්කර බද්දක් නොගෙවීම සම්බන්ධයෙන් ඒ බද්ද අයවිය යුතු ස්ථානයේ අයිතිකරුගේ දේපල තහනමට ගෙන විකිණීමෙන් එම බදු මුදල් අයකර ගත යුතු වුවද, කොට්ඨාශ 2 කින් 2010 දෙසැම්බර් 31 දින රු.220,132 ක් හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 <u>මස් හා මාළුකඩ හිඟ බදු</u>

1991 වර්ෂයේ සිට 1997 වර්ෂය දක්වා කාලය තුල බදු දෙන ලද මස් හා මාළුකඩ වලින් හිඟ බදුකුලී හා දඩ මුදල් වශයෙන් රු.94,701 ක මුදලක් අයකර ගැනීමට තිබුණි.

## 2.2.6 ආදායම් අයකර ගැනීමේ දුර්වලතා

2010 දෙසැම්බර් 31 දිනට ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව අනුව හිඟ ආදායම රු.4,622,192 ක් වූයෙන් ආදායම් අයකර ගැනීම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

2010 වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම රු.41,437,627 ක් වූ අතර වර්ෂයේ තථ්‍ය ආදායම රු.32,597,086 ක් වූයෙන් ඇස්තමේන්තුගත ආදායම රු.8,840,541 කින් අඩු වී තිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම්, අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 23,411 | 17,822 | 5,589 | 15,795 | 16,025 | (230) |
| අනෙකුත් | 9,406 | 5,908 | 3,498 | 9,325 | 3,786 | 5,539 |
| උප එකතුව | 32,817 | 23,730 | 9,087 | 25,120 | 19,811 | 5,309 |
| ප්‍රාග්ධන වියදම | 22,213 | 10,194 | 12,019 | 25,252 | 9,953 | 15,299 |
| මුළු එකතුව | 55,030 | 33,924 | 21,106 | 50,.372 | 29,764 | 20,608 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 02 | 02 |
| ද්විතියක | 22 | 20 |
| ප්‍රාථමික | 37 | 31 |
| වෙනත් ( අනියම්,තාවකාලික) | - | 20 |

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු8,518,739 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු.8,518,739 ක් විය.

2.5.2 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු3,490,635 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.286,014 ක් විය.

2.5.3 අචල ජංගම වත්කම්

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් වල අගය රු. 44,050 ක් විය.

2.6 සමීක්ෂණය නොකල වත්කම්

භෞතික සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවූ 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම් වල වටිනාකම රු.20,311,279 ක් විය.

2.7 අරමුණු වලින් බාහිර ක්‍රියාකාරකම්

පළාත් පාලන කොමසාරිස්ගේ 2009 සැප්තැම්බර් 02 දිනැති අංක ඒසීඑල්ජ්/01/අයවැය දරන ලිපියෙන් පළාත් පාලන ආයතන සඳහා මූලාධාර යෙදවිය යුතු විශේෂිත නිර්ණායකයන් දක්වා තිබුණද එයට පටහැනිව රු.525,750 ක වියදමක් දරා තිබුණි.

2.8 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂයක් පාසා වැඩිවෙමින් පවතින රු.4,553 ක්වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේ අයවැය ලේඛනයේ වැඩ සටහන් පහක් යටතේ වැය ශීර්ෂ 47 ක් සඳහා රු.13,403,810 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී එම වැය ශීර්ෂ වලින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

2.9 <u>කාර්ය සාධනය</u>

වාර්ෂික ක්‍රියාකාරී සැළැස්මට අනුකූල නොවීම, මූල්‍ය හා භෞතික කාර්ය සාධනයේ විචලනයන් සඳහා ක්‍රියා මාර්ග නොගැනීම හේතුවෙන් ඉලක්කගත අරමුණු ළඟා කරගත නොහැකි වී තිබුණි.

2.10 <u>කොන්ත්‍රාත් පරිපාලනය</u>

ඇස්තමේන්තුගත පිරිවැය රු.200,000 ක් වූ ව්‍යාපෘති 02 ක් ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් දක්නට තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) කොන්ත්‍රාත් පාලනය

(ඉ) ගබඩා පාලනය